# විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
# விஞ்ஞான மற்றும் தொழிநுட்ப அமைச்சு
# Ministry of Science and Technology

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | MOST/ADM(VIDATHA)/13/<br>ANNU TR/FC/26 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.08. |

**විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය**
**විදාතා කාර්ය මණ්ඩල අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටිය - 2026**

**01.** මෙම ස්ථාන මාරු පටිපාටිය විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයෙහි විදාතා ඒකකය යටතේ විදාතා සම්පත් මධ්‍යස්ථානවල / ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල / දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවය කරන නිලධාරීන් ස්ථාන මාරු කිරීම සඳහා අදාළ වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය වේ.

1.1 මෙම ස්ථාන මාරු පටිපාටිය අනුව පත්කරනු ලබන ස්ථාන මාරු මණ්ඩලයක් මගින් වාර්ෂික ස්ථාන මාරු සඳහා කැඳවනු ලබන අයදුම්පත් සහ අදාළ අනෙකුත් කරුණු සලකා බලා ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කරනු ලැබේ.

1.2 වාර්ෂික ස්ථාන මාරුවලින් පරිබාහිරව අනුමත කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව නොඉක්මවන පරිදි පහත දැක්වෙන හේතූන් මත ස්ථාන මාරු කළ යුතු යැයි විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශ ලේකම් අදහස් කරන විට ඒ සඳහා ඔහුට / ඇයට බලය පැවරේ.

I. සේවා අවශ්‍යතාව මත
II. අන්‍යෝන්‍ය ස්ථාන මාරු
III. රජයේ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ මත
IV. විනය හේතූන් මත

**02.** මෙම ස්ථාන මාරු පටිපාටිය යටතට පහත සඳහන් තනතුරු දරන්නන් ඇතුළත් වේ.

I. විද්‍යා හා තාක්ෂණ නිලධාරී/ සංවර්ධන නිලධාරී/ තාක්ෂණ හා මානව සම්පත් ප්‍රවර්ධන සහකාර
II. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර / පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු
III. ක්ෂේත්‍ර සම්බන්ධීකාරක
IV. කාර්යාල කාර්ය සහායක
V. කාර්යාල මුරකරු

**03.** වාර්ෂික ස්ථාන මාරුවීම

3.1 ස්ථාන මාරු අපේක්ෂා කරන නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටුකිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල ක්‍රියාත්මක කෙරේ.

3.2 ස්ථාන මාරු මණ්ඩල ස්ථාපනය කිරීම

3.2.1 අමාත්‍යාංශය ලේකම් විසින් විදාතා කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ ස්ථාන මාරු මණ්ඩල වාර්ෂිකව හෝ අවශ්‍ය පරිදි කලින් කලට ස්ථාපනය කෙරේ.

3.3 එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක / විදාතා සම්පත් මධ්‍යස්ථානයක/ දිස්ත්‍රික් විදාතා ඒකකයක නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරියකුට විදාතා ඒකකය යටතේ ක්‍රියාත්මක වන විදාතා සම්පත් මධ්‍යස්ථානයකට / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට/ දිස්ත්‍රික් විදාතා ඒකකයකට ස්ථාන මාරුවක් ලබාගැනීමට අයදුම් කළ හැකිය.

3 වන මහල, "සෙත්සිරිපාය" 1 වන අදියරය, බත්තරමුල්ල.
3வது தளம், "செத்சிறிபாய" கட்டம், பத்தரமுல்லை.
3rd floor, "Sethsiripaya" Stage I, Battaramulla.

කාර්යාලය / காரியாலயம் / Office
☎ (+9411) 2879410
(+9411) 2879412
motrdevelopment@gmail.com
www.mostr.gov.lk

3.4 එවැනි අයදුම්පත් නියමිත පරිදි විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (විද්‍යාතා) වෙත ඉදිරිපත් කළ යුතු වේ.

3.5 ස්ථාන මාරුවලදී සලකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති පහත පරිදි වේ.

3.5.1 වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී සුදුසුකම් ලබන සේවා කාලය ගණනය කරනු ලබන්නේ පවත්නා වර්ෂයේ දෙසැම්බර් 31 දිනටය.

3.5.2 සේවා කාලය ගණනය කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක / දිස්ත්‍රික් විද්‍යාතා ඒකකයක අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

3.5.3 යම් නිලධාරියෙකු එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක / දිස්ත්‍රික් විද්‍යාතා ඒකකයක වසර 05ක් සේවයේ නිරතව සිටී නම්, ස්ථාන මාරු අපේක්ෂිත, සේවා කාලයේ සම්පූර්ණ නිලධාරීන්ට ස්ථාන මාරු ලබාදිය හැකි වන පරිදි ඔහුගේ / ඇයගේ කැමැත්ත නොමැතිව ද ස්ථාන මාරුවක් ලැබීමට යටත් වනු ඇත.

3.5.4 නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති විට වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කිරීම නිලධාරියාගේ වගකීම වන අතර එසේ අයදුම් නොකරන නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි පුරප්පාඩු පවතින විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන / ප්‍රාදේශීය ලේකම් කාර්යාල / දිස්ත්‍රික් විද්‍යාතා ඒකක වෙත ස්ථාන මාරු කරනු ලැබේ.

3.5.5 ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය ස්ථාන මාරු ක්‍රියාත්මක කරන වර්ෂයේ ජනවාරි 01 දින වේ.

3.5.6 ස්ථාන මාරුවීම් අපේක්ෂා නොකරන එහෙත් යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක / දිස්ත්‍රික් විද්‍යාතා ඒකකයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්, ස්ථාන මාරු කළහොත් යාමට අපේක්ෂා කරන විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන / ප්‍රාදේශීය ලේකම් කාර්යාල / දිස්ත්‍රික් විද්‍යාතා ඒකක සඳහන් කර ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අනිවාර්යයෙන්ම නියමිත දිනට පෙර අයදුම්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොවුනහොත් ස්ථාන මාරු මණ්ඩලයේ තීරණයන්ට යටත්ය.

3.5.7 ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ හා ඉදිරිපත් නොකළ වර්තමාන සේවා ස්ථානයේ වසර 05කට වඩා වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් පිළිබඳ තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර පවත්වා ගැනීම අමාත්‍යාංශයේ පාලන අංශය සතු වගකීමකි.

3.5.8 නිලධාරියාගේ ඉල්ලීම, විද්‍යාතා ඒකකයේ අවශ්‍යතාවය ආදී විශේෂිත කරුණු නිසා මිස එසේ නොමැති නම් සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු 57 ඉක්මවූ නිලධාරීන් දුෂ්කර විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන / ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ස්ථාන මාරු නොකළ යුතුය.

3.5.9. නිලධාරීන්ගේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු ලබා ගන්නේ නම් එම සේවා ස්ථානය අදාළ නිලධාරියාට ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස සලකනු ලබයි.

3.5.10. යම්කිසි නිලධාරියෙකු තමන් ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සේවය කරයි නම් එම කොට්ඨාසය දුෂ්කර ලෙස නම් කර තිබුණද එම නිලධාරියාට එය ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස සලකනු ලබයි.

3.5.11 විදාතා සම්පත් මධ්‍යස්ථානයක / දිස්ත්‍රික් විදාතා ඒකකයක සේවය කළ කාලය ගණන් බැලීමේ දී, නිලධාරියකුගේ පාලනයෙන් බැහැර හේතුවක් මත සේවයේ යෙදී නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

3.5.12 විදාතා සම්පත් මධ්‍යස්ථානයේ / දිස්ත්‍රික් විදාතා ඒකකයේ අඛණ්ඩව වසර 02ක් සේවය කර තිබීම සහ නව පත්වීමක් ලැබූ නිලධාරියකු නම් මුල් සේවා ස්ථානයේ වසර 03ක් වත් සේවය කර තිබීම ස්ථාන මාරුවක් සඳහා අයදුම් කිරීමට සුදුසුකම වේ.

3.5.13 නිලධාරියෙකුගේ ඉල්ලීම අනුව කරන ලද ස්ථාන මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව අභියාචනා කිරීමට එම නිලධාරියාට හෝ ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට අධීක්ෂණ නිලධාරීන්ට හෝ හිමිකමක් නොමැත.

3.5.14 ස්ථාන මාරු ලබාදීමේදී තම පදිංචි ප්‍රදේශයෙන් බැහැරව අවම වශයෙන් වසර 03ක් වත් සේවය කර ඇති නිලධාරීන්ගේ ඉල්ලීම් සඳහා ප්‍රමුඛත්වය ලබාදේ. යම්කිසි විනය කරුණක් මත ස්ථාන මාරු කර ඇති නිලධාරීන් එම නිශ්චිත කාලය අවසන් වන තෙක් ස්ථාන මාරු සඳහා අයදුම් නොකළ යුතුය.

3.5.15 මීට ඉහත කරන ලද වාර්ෂික ස්ථාන මාරුවලින් පසු එක් වරක් හෝ සුහද මාරු හෝ තාවකාලික ස්ථාන මාරු ලැබූ නිලධාරීන්ට වඩා අනෙක් නිලධාරීන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**04.** ස්ථාන මාරු කමිටුවේ කාර්යභාරය

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයෙහි XVIII වැනි පරිච්ඡේදයේ විධිවිධානවලට සහ මෙම ස්ථාන මාරු පටිපාටියේ දැක්වෙන කරුණුවලට යටත්ව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 253 වගන්තියේ I හා II උපවගන්තිවල විධිවිධානවලට අනුව කටයුතු කිරීමේදී අමාත්‍යාංශ ලේකම් වෙත නිර්දේශ ලබාදීම ස්ථාන මාරු කමිටුවල කාර්යභාරයයි.

**05.** වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම

5.1 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය පහත පරිදි විය යුතුය.

I. අධ්‍යක්ෂ (විදාතා) - කමිටු සභාපති
II. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) - කමිටු සාමාජික
III. සේවා නියෝජිතයන් දෙදෙනෙක් - කමිටු සාමාජික

(අංක 02හි සඳහන් පරිදි තනතුරු සඳහා වෙන වෙනම ස්ථාන මාරු මණ්ඩල සකස් කෙරේ.)

**06.** අභියාචනා සම්බන්ධ කටයුතු

6.1 නියමිත දිනට පෙර කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ අංක 15 පරිශිෂ්ටය ප්‍රකාරව අභියාචනා ඉදිරිපත් කළ යුතුය.

6.2 ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 254 වගන්තියේ I උපවගන්තිය අනුව ස්ථාපනය කරනු ලබන වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් උක්ත කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ 253 වගන්තියේ V උපවගන්තිය අනුව අදාළ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු ලබන්නේ එහි 254 වගන්තියෙහි V උපවගන්තියේ දැක්වෙන කරුණුවලට අනුකූල වේ නම් පමණි.

6.3 ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් පහත් සඳහන් කරුණු පිළිබඳ පරීක්ෂා කර තීරණ ගනු ඇත.

ස්ථාන මාරුවීම්

- ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන මාරුවීම්
- නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටු නොවුණු අවස්ථා
- නිලධාරීන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්
- ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනයෙන් පසුව නිලධාරීන්ට සිදුවූ හදිසි කරදර අසනීප වැනි සානුකම්පිත තත්ත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒ පිළිබඳව

6.4 යෝජිත වාර්ෂික ස්ථාන මාරුවලින් අතෘප්තියට පත් නිලධාරීන් නියමිත කාලය තුළ (දින 15ක් තුළ) තම අභියාචනා අමාත්‍යාංශය වෙත හෝ අතිරේක ලේකම් (පාලන) වෙත ඉදිරිපත් කළ යුතු වේ.

6.5 වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සමාලෝචන කමිටුව පහත පරිදි පත් කළ යුතු ය.

I. අතිරේක ලේකම් (පාලන) - කමිටු සභාපති
II. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - කමිටු සාමාජික
III. සේවා නියෝජිතයෙක් - කමිටු සාමාජික
(ස්ථාන මාරු මණ්ඩලයට සහභාගී නොවූ නියෝජිතයකු විය යුතු ය.)

6.6 ස්ථාන මාරු සිදු කරන වසරේ නොවැම්බර් 10 දිනට පෙර මෙම සමාලෝචන කමිටුව විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සලකා බලා එම නිර්දේශ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුවේ. එම නිර්දේශ සඳහා පදනම් වූ හේතු ද එම වාර්තාවේ අඩංගු විය යුතු ය.

6.7 වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ යෝජනා ද, වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සමාලෝචන කමිටුවේ නිර්දේශ ද සලකා බලා අමාත්‍යාංශ ලේකම් විසින් වාර්ෂික ස්ථාන මාරු නියෝග අදාළ වසරේ නොවැම්බර් 15 දිනට පෙර නිලධාරීන්ට දැනුම් දිය යුතුය.

6.8 වාර්ෂික ස්ථාන මාරු ලබන සියලුම නිලධාරීන් නියමිත දිනට එම නියෝග පරිදි නියමිත බලධාරීන් වෙත රාජකාරියට වාර්තා කළ යුතුය.

**07.** ස්ථාන මාරු සඳහා කාල සටහන

| | | |
|---|---|---|
| I. | වාර්ෂික ස්ථාන මාරු කැඳවීම පිළිබඳව දැනුම්දීම | - **2025.08.06** දින |
| II. | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය | - **2025.08.25** දින |
| III. | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ස්ථාන මාරු කමිටුවට භාරදීම | - **2025.09.01** දිනට පෙර |
| IV. | වාර්ෂික ස්ථාන මාරු යෝජනා අමාත්‍යාංශ ලේකම් වෙත භාරදීම | - **2025.09.23** දිනට පෙර |
| V. | වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | - **2025.09.30** දින |
| VI. | අභියාචනා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය | - **2025.10.15** දින |
| VII. | අභියාචනා සමාලෝචනය අවසන් කිරීම | - **2025.11.07** දිනට පෙර |
| VIII. | අවසන් ස්ථාන මාරු යෝජනා අමාත්‍යාංශ ලේකම් වෙත භාරදීම | - **2025.11.10** දින |
| IX. | අවසන් ස්ථාන මාරු නියෝග දැනුම් දීම | - **2025.11.15** දිනට පෙර |
| X. | ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය | - **2026.01.01** |

**08.** මෙම වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට යටත්ය.

**09.** මෙම ස්ථාන මාරු පටිපාටියෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳව අමාත්‍යාංශ ලේකම් විසින් සේවා අවශ්‍යතාවය මත අදාළ වන ලෙසට තීරණ ගනු ලබන්නේය.